රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

2020.04.01

අධ්‍යක්ෂ ප්‍රවෘත්ති

ප්‍රවෘත්ති කර්තෘ

නිවේදන අංක : 99 /2020
නිකුත් කරන ලද වේලාව : 13.10

**ශ්‍රී ලංකාවේ විදේශිකයන් සඳහා වීසා බලපත්‍ර දීර්ඝ කිරීම සම්බන්ධ ප්‍රවෘත්ති නිවේදනය**

ශ්‍රී ලංකාවේ විදේශිකයන් සඳහා වීසා බලපත්‍ර දීර්ඝ කිරීම පිළිබඳව ආගමන හා විගමන පාලක ජනරාල් විසින් මාධ්‍ය වෙත නිකුත් කිරීම සඳහා අප වෙත එවන ලද ප්‍රවෘත්ති නිවේදනය පහත සඳහන් පරිදි වේ.

ශ්‍රී ලංකාවේ වෙසෙන විදේශිකයන් සඳහා වීසා බලපත්‍ර දීර්ඝකිරීම සම්බන්ධයෙන් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2020.03.17 දිනැති නිවේදනයට වැඩිමනත් වශයෙනි. ඒ අනුව දැනට ලබාගෙන ඇති සියලුම වර්ගයේ වීසාවන්හි වලංගු කාලය 2020 මාර්තු 14 දින සිට 2020 අප්‍රේල් 12 වන දින තෙක් දින 30ක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී.

කොවිඩ් -19 වෛරසය රට තුළ ව්‍යාප්ත වීම පිළිබඳව සලකා බලා, දැනට ශ්‍රී ලංකාවට පැමිණී සිටින විදේශිකයන් ලබාගෙන ඇති සියලුම වර්ගයේ වීසාවන්හි වලංගු කාලය තවත් දින 30 කින් දීර්ඝකිරීමට තීරණය කර තිබේ.

එබැවින් පහත දක්වා ඇති උපදෙස් පරිදි කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු

1) දැනට ලබාදී ඇති සියලුම වර්ග වල වීසා බලපත්‍රයන්හි වලංගු කාලය **2020 මැයි 12 දින තෙක්** දීර්ඝ කරනු ලැබේ.

2) එම වීසා දීර්ඝ කිරීමට අදාළව, වීසා ගාස්තු ගෙවීම හා වීසාව ගමන් බලපත්‍රයේ පිටසන් කර ගැනීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය ඉදිරියේදී ඔබ වෙත දැනුම් දෙනු ලැබේ.

3) එබැවින්, පෙර නිවේදනයේ සඳහන් දිනයන්හිදී ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ වීසා අංශයට පැමිණීමෙන් වළකින ලෙස මෙයින් වැඩිදුරටත් දැනුම් දෙනු ලැබේ.

4) මෙම කාලය තුළදී ඔබ දිවයිනෙන් බැහැර වීමට අදහස් කරන්නේ නම්; ඉහත වීසා දීර්ඝ කිරීමට අදාළ වීසා ගාස්තු පමණක් ගුවන්තොටුපල වෙත ගෙවා දිවයිනෙන් බැහැර වී යා හැක. එහිදී කිසිදු දඩ මුදලක් ඔබගෙන් අය කරනු නොලැබේ.

5) ඔබ දැනටමත් වීසා ලබාගැනීම සඳහා ගමන් බලපත්‍ර, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ වීසා අංශය වෙත ලබාදී ඇත්නම්, එහිදී ඔබ වෙත ලබා දී ඇති පිළිගැනීම් රිසිට් පත්‍රයෙහි (Acknowledgement) වලංගු කාලය ද **තවත් දින 30 කින් එනම් 2020 මැයි 12 දින තෙක්** දීර්ඝ කර ඇත. මෙම කාලය තුළදී ඔබ දිවයිනෙන් බැහැර වීමට අදහස් කරන්නේ නම් **පමණක්** ඔබගේ ගමන් බලපත්‍රය මෙම දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීම සඳහා ඉල්ලීමක්, අදාල පිළිගැනීම් රිසිට්පතේ(Acknowledgement) පිටපතක් හා ගුවන් ගමන් ටිකට් පත්‍රයෙහි පිටපතක් සමඟ පහත සඳහන් විද්‍යුත් ලිපිනයන් වෙත යොමු කළ යුතු අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් දෙපාර්තමේන්තුව විසින් ඒ ඒ අවස්ථාවන්හිදී ඔබ වෙත ලබා දෙනු ඇත.

i. **dcvisa@immigration.gov.lk**
ii. **acvisa@immigration.gov.lk**
iii. **acvisa1@immigration.gov.lk**
iv. **acvisa2@immigration.gov.lk**
v. **aceta@immigration.gov.lk**

වැඩිදුර විමසීම් සඳහා: **077-1588724**

This is further to the previous notice released by the Department of Immigration and Emigration on 17.03.2020 with regard to the extension of visas for the Foreigners residing in Sri Lanka.

Accordingly, the validity period of all types of Visas had been extended for a period of 30 days with effect from 14th March 2020 to 12th April 2020.

Having considered the spread of Covid-19 virus in the country, it has been decided to further extend the validity period of all types of Visas issued to all foreigners who are currently residing in Sri Lanka from another 30 days.

1) The validity period of all types of Visas will be extended till **12th May 2020.**

2) The procedure to pay the relevant visa fee and to get the visa endorsed in the Passport will be informed to you later. Hence, you are hereby informed **to refrain from visiting the Visa Division of the Department of Immigration and Emigration**as mentioned in the previous notice.

3) If you intend to leave the island during the aforementioned period; your journey will be facilitated by paying the relevant visa fee at the Airport without any penalty.

4) The validity period of the Acknowledgements issued for the applications **already submitted to the Department of Immigration and Emigration** to obtain visas, will also be extended for another period of 30 days; till **12th May 2020.** If you intend to leave the country during the given period, a request to obtain your passport along with a scan copy of the Acknowledgement and the flight ticket should be sent to the following email addresses. Necessary advises in this regard, will be communicated to you accordingly via the same channel.

   I. **dcvisa@immigration.gov.lk**
   II. **acvisa@immigration.gov.lk**
   III. **acvisa1@immigration.gov.lk**
   IV. **acvisa2@immigration.gov.lk**
   V. **aceta@immigration.gov.lk**

   **For Inquiry: 0771588724**

මෙම ප්‍රවෘත්ති නිවේදනයේ දමිළ භාෂා පරිවර්තනය මේ සමඟ අමුණා ඇති අතර මෙම නිවේදනය සුදුසු පරිදි ප්‍රචාරය කිරීම සඳහා ඔබ වෙත එවමි.

නාලක කලුවැව

රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්